# 2.18 සීගිරිය තදාශ්‍රිතයෙන් ලැබුණු අප්‍රකාශිත පුවරුලිපි කැබැල්ලක්

නිලන්ති බණ්ඩාර
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

---

## ABSTRAT

ශ්‍රී ලංකාවේ විවිධ පළාත් ආශ්‍රිත ව අඩු වැඩි වශයෙන් ශිලාලේඛන ව්‍යාප්ත ව ඇත. පැරණි ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, ආගමික වැනි තොරතුරු අධ්‍යයනය කිරීමේ දී ශිලාලේඛනවලට විශේෂත්වයක් හිමි වේ. තොරතුරුවලට සමකාලීනව ලිපිය කෙටීම මෙයට මූලික හේතුවයි. ශිලාලේඛන කියවීමේ මූලික කාර්යයට උරදුන් ඊ. මුලර්, ගෝල්ඩ් ස්මිදර්, එච්.සී.පී. බෙල්, පරණවිතාරණ (Paranavitana , 1983, 2001) වැනි විද්වතුන් විසින් එතෙක් සොයාගත් ශිලාලේඛනයන් පිළිබඳ වාර්තා කර ඒවා කියවා ප්‍රකාශයට පත් කර තිබේ. මෙම කීර්තිමත් විද්වතුන් විසින් නො කිය වූ මෙන් ම අළුතින් අනාවරණය කරගත් ශිලාලේඛන රාශියක් තවමත් අප සතුව පවතී.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ සීගිරිය පුරාවිද්‍යා භූමිය අවටින් සොයාගත් අප්‍රකාශිත පුවරු ලිපි කැබැල්ලක් කියවීම හා ඒ පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වෙයි.

ශිලාලේඛන පුවරුවෙහි වම්පස කැඩී ඇත. අක්ෂර සහිත දකුණු භාගය දැනට කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ පුරාවිද්‍යා හා මානවවිද්‍යා අධ්‍යයන කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ. 1982 දී සංස්කෘතික ත්‍රිකෝණ සීගිරි ව්‍යාපෘතිය මගින් සීගිරිය පුරාවිද්‍යා භූමි ප්‍රදේශයේ ඇති ශිලාලේඛන පිළිබඳ සංගණනයක් සිදුකර තිබෙන අතර මෙම ශිලාලේඛනය එයට ඇතුලත් වී නොමැත (රණවැල්ල, 1984) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලියාපදිංචි අංකයක් හිමි නොවූ මෙම පුවරුව පිළිබඳ ප්‍රකාශිත කිසිදු ග්‍රන්ථයකින් ද තොරතුරු අනාවරණය නොවේ. උක්ත ශිලාලේඛනයෙන් ඉස්මතුවන සමකාලීන සමාජය පිළිබඳ විවරණයක් මෙන් ම අක්ෂර විද්‍යාත්මක වැදගත්කම මෙම පර්යේෂණ පත්‍රකාව මගින් හෙළිදරව් කෙරේ.

### ආශ්‍රිත ග්‍රන්ථ

**Paranavitana , S** **1983** **Inscriptions of Ceylon, Vol. II (part I).Department of Archaeology, Colombo.**

**Paranavitana , S** **2001** **Inscriptions of Ceylon, Vol. II(part II).Department of Archaeology, Colombo.**

රණවැල්ල, එස්. 1984 අභිලේඛන විද්‍යාව, සීගිරිය ව්‍යාපෘතිය ප්‍රථම පුරාවිද්‍යාත්මක කැණීම් පර්යේෂණ වාර්තාව, සේනක බණ්ඩාරණායක, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.